# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2078/53 – 2018 ජූලි 06 වැනි සිකුරාදා – 2018.07.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය*: IR/15/19/2012.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය**

අංක 2045/37 දරන හා 2017.11.16 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් කඩුවෙල, හේවාගම, රාමහැර පාර, අංක 129/3/බී හි පදිංචි සමිත දිසානායක මහතා ඇතුළු සේවකයින් 111 දෙනෙකු හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 303හි පිහිටි ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 3571 දරන හා 2017.08.02 දිනැති ප්‍රදනය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටත් නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 3571 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2018.11.16 දින සිට අවසන් වන බවට පනතේ 20(2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ජුනි මස 29 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පළමුවන උපලේඛනය

"අ" ආකෘති පත්‍රය

(3 වන නියෝගය)

## 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත
## බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම

ලිපිනය: අංක 303, බෞද්ධාලෝක මාවත,
කොළඹ - 07.

දිනය: 2018 මැයි 04 දින.

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය.

2017.11.16 දිනැති අංක 2045/37 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද්ද වූ ද සමිත දිසානායක මයා ඇතුළු සේවකයින් 111 දෙනෙකු සහ ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව බැඳී සිටින්නා වූ ද, 2017.08.02 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**සිතේන්ද්‍ර සේනාරත්න,**
**සභාපති**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව,
303, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

පිටපත: (අනෙක් පාර්ශ්වය) - සමිත දිසානායක මයා ඇතුළු සේවකයින් 111 දෙනෙකු, අංක 129/3/බී, රාමහැර පාර, හේවාගම, කඩුවෙල.

1. ප්‍රතික්ෂේප කරන පාර්ශ්වය, වෘත්තිය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශ්වයකටම, වෘත්තිය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුටම වෙන වෙනම දැන්වීම් යැවිය යුතු ය. (පනතේ 9(1), 15(1) හා 20(1) වන වගන්තිය බලන්න.)

2 දැන්වීම් අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශ්වයක්, සේවායෝජකයෙකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශ්වයක්, සේවායෝජකයකු වෘත්තිය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් ද යන වග ද වෘත්තිය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුර ද නිශ්චිතව සඳහන් කළ යුතු ය.

07 - 691

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.